(33)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 780/7 — 1993 අගෝස්තු 17 වැනි අඟහරුවාද — 1993.08.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී— බී. 91/49.

ඩී/එල්ජීඑල්/ඒවයි— 13 (1).

### යුද්ධ හමුදා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 44 (2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු (357 අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සම්පාදිත නියෝග.

ආර්. ප්‍රේමදාස,
ජනාධිපති.

1992 ඔක්තෝබර් මස 08 වැනි දින,

කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බලසේනා) සේවා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I කොටස

2. (1) (අ) වැඩ බැලීමේ පත්වීම් ද ඇතුලු සියලු යුදහමුදා පත්වීම් ද මාරු කිරීම්, ඉල්ලා අස්වීම්, ජ්‍යෙෂ්ඨතාවය ප්‍රතිශෝධනය කිරීම්, ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවීම්, ඉවත් කිරීම්, ද්විතියනය කිරීම්, මේජර් නිලය ඇතුළුව ඊට ඉහළ නිලවලට උසස් කිරීම් ජනාධිපතිවරයා විසින් අනුමත කිරීමෙන් පසු ගැසට් පත්‍රයේ පළකළ යුතුය. තත්කාර්ය සඳහා වූ සියලු නිර්දේශ සාමාන්‍ය යුද හමුදා ක්‍රියා මාර්ගය ඔස්සේ යුද හමුදාපති වෙත ඉදිරිපත් කළ යුතු අතර, ජනාධිපතිවරයාගේ අනුමතය සඳහා, යුද හමුදාපති විසින් ඒවා රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) කපිතාන් නිලයද ඇතුළුව ඒ නිලය දක්වා වූ උසස් කිරීම් යුද හමුදාපති විසින් කරනු ලැබිය යුතු අතර ඔහු විසින් ඒවා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් නොකරන ලද සියලුම නිලධාරීන්ගේ පත් කිරීම් ද ඒ සමාන හෝ ඊට ඉහළ නිලයකට කවර හෝ කාල පරිච්ඡේදයක් සඳහා කෙරෙන වැඩ බැලීමේ පත්වීම් ද යුද්ධ හමුදාපති විසින් කළ යුතු අතර එවැනි පත් කිරීම් සඳහා ජනාධිපතිවරයාගේ අනුමතය අවශ්‍ය නොවන අතර ඒවා ගැසට් පත්‍රයේ පළ කිරීම ද අවශ්‍ය නොවනු ඇත.

(2) ඉහත සඳහන් කාර්ය සඳහා වූ සියලුම නිර්දේශ ජනාධිපතිවරයාගේ අනුමතිය සඳහා සාමාන්‍ය යුද හමුදා ක්‍රියාමාර්ගය ඔස්සේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) ක්වාටර් මාස්ටර් අයත් වන නිලයම දරන වෙනත් අයකුට වඩා ක්වාටර් මාස්ටර් කණිෂ්ඨයකු වන අවස්ථාවල දී හැර අනෙකුත් අවස්ථාවල දී ක්වාටර් මාස්ටර් ඇතුළු සියලුම යුද්ධ හමුදා නිලධාරීන් කෙරෙහි මෙහි පහත දක්වා ඇති නිලතල අනුපිළිවෙළ අදාල වන්නේය :—

(අ) ජනරාල්
(ආ) ලුතිනන් ජනරාල්
(ඇ) මේජර් ජනරාල්
(ඈ) සේනාංකාධිකාරි (බ්‍රිගේඩියර්)
(ඉ) කර්නල්
(ඊ) ලුතිනන් කර්නල්
(උ) මේජර්
(ඌ) කපිතාන්
(එ) ලුතිනන් සහ
(ඒ) දෙවැනි ලුතිනන්

GP 2382



(4) ඉහත (3) වන ඡේදයේ දක්වා ඇති නිල දරන සියලුම නිලධාරින්ගේ වැටුප් හා දීමනා ප්‍රමාණයන් අදාල අවස්ථාවේදී බල පැවැත්වෙන යුද්ධ හමුදා වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ නියම කර ඇති ආකාරයට විය යුතුය.

(5) (3) වන ඡෙදයේ දක්වා ඇති නිල දරන නිලධාරීන් විශ්‍රාම යන විට ඔවුන්ගේ නිත්‍ය විශ්‍රාම වැටුප හෝ තාවකාලික විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික අදාල අවස්ථාවේදී බලපැවැත්වෙන යුද්ධ හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහයෙන් නියම කෙරෙන ආකාරයට විය යුතුය.

3. (අ) යුද්ධ හමුදාවේ නිලධාරින් වශයෙන් පළමුවැනි අධිකාරවලට පත් කිරීම සඳහා සෙබළුන් ඇතුළු පුද්ගලයන් තේරීමේ සහ ශිෂ්‍ය භටයන් තේරීමේ කාර්යයන් සඳහා මූලික තේරීම් මණ්ඩල එකක් හෝ කිහිපයක් හා අවසන් තේරීම් මණ්ඩලයක් ද තිබිය යුතුය.

(ආ) අවසාන තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම සඳහා අපේක්ෂකයන් මූලික තේරීම් මණ්ඩලය විසින් තෝරා ගත යුතු අතර එම මූලික තේරීම් මණ්ඩලය පහත දක්වෙන අයගෙන් සමන්විත විය යුතුය :—

(i) මණ්ඩලයේ සභාපති විය යුතු කර්නල් නිලයට පහළ නොවන නිලයක් දරන්නා වූද, යුද්ධ හමුදපති විසින් නම් කරන ලද්දවූ ද නිලධාරියෙක් ;

(ii) යුද හමුදපති විසින් නම් කරන ලද්ද වූද, ලුතිනන් කර්නල් නිලයට පහළ නොවූ නිලයක් දරන්නා වූ ද, එක් නිලධාරියෙක් හෝ ඊට වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් ; සහ

(iii) රාජ්‍ය ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයෙක්,

(ඇ) මූලික තේරීම් මණ්ඩලය විසින් තෝරන ලද අය අතුරෙන් අධිකාර සඳහා සුදුසු වන අපේක්ෂකයන් හා පුහුණුව සඳහා සුදුසු වන ශිෂ්‍ය භටයන් අවසාන තේරීම් මණ්ඩලය විසින් තෝරා නිර්දේශ කළ යුතු අතර, එම අවසාන තේරීම් මණ්ඩලය පහත දක්වෙන අයගෙන් සමන්විත විය යුතුය :

(i) මණ්ඩලයේ සභාපති විය යුතු රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්,

(ii) යුද හමුදපති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් සහ,

(iii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන යටත් පිරිසෙයින් තවත් එක් තැනැත්තෙක්,

## II කොටස

### අධිකාර හා පත්වීම—පළමුවැනි අධිකාර

දෙවැනි ලුතිනන්වරු

4. පහත දක්වෙන තැනැත්තන්ට, යුද්ධ හමුදවේ දෙවැනි ලුතිනන් වරයකු වශයෙන් වූ අධිකාරයක් නිකුත් කළ හැකිය :—

(1) යුද හමුදපති විසින් තිරණය කෙරෙන අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති හා ඔහු විසින් තීරණය කෙරෙන පාඨමාලා සාර්ථකව නිම කොට ඇති ශිෂ්‍ය භටයකුට හෝ

(2) යුද හමුදපති විසින් තිරණය කෙරෙන සුදුසුකම් ඇත්තා වූ හා අවසාන තේරීම් මණ්ඩලය විසින් තෝරා ගනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තෙකුට හෝ,

(3) වයස අවුරුදු 30 ට නොවැඩි වූද, කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අවසාන තේරීම් මණ්ඩලය විසින් තිරණය කෙරෙන ඒ හා සමාන වෙනත් විභාගයක් හෝ සමත්ව ඇත්තා වූ ද නිත්‍ය හමුද භටයකුට

ලුතිනන්වරු, කපිතාන්වරු හා මේජර්වරු,

5. (1) අවසන් තේරීම් මණ්ඩලය විසින් තේරීමෙන් අනතුරුව පහත දක්වෙන තැනැත්තන්ට ලුතිනන්වරයෙකු වශයෙන් වූ අධිකාරයක් නිකුත් කළ හැකිය :—

(අ) වයස අවුරුදු 35 කට නොඅඩුවූද, කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ යුද හමුදපති විසින් තිරණය කෙරෙන වෙනත් ඒ හා සමාන පරීක්ෂණයක් හෝ සමත්ව ඇත්තා වූ ද ක්වාටර් මාස්ටර් වශයෙන් පත් කරනු ලැබ සිටින බලලත් නිලධාරියකුට හෝ අධිකාර නොලත් නිලධාරියකුට : හෝ

(ආ) වයස අවුරුදු 29 ට නොවැඩි වූ ද, ස්වේච්ඡා බලකායේ සක්‍රිය නාම ලේඛනයට ඇතුලත්වූ ද, ලුතිනන් නිලයට පහළ නොවන නිලයක අවුරුදු තුනකට නොඅඩු කාර්යක්ෂම අධිකාර ලත් සේවයක් ඇත්තා වූ ද යුද්ධ හමුදපති විසින් තීරණය කරනු ලබන ආකාරයේ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සහිත වූ ද නිලධාරියෙකුට, හෝ

(ඇ) වයස අවුරුදු 37 ට නොඅඩු වූද, ලුතිනන් නිලයේ හෝ ලුතිනන් ක්වාටර් මාස්ටර් නිලයේ අධිකාර ලබාදීමට සුදුසු යයි යුද්ධ හමුදපති විසින් අදහස් කරන වෘත්තිය හෝ ශිල්පිය සුදුසුකම් ඇත්තාවූ ද තැනැත්තන්ට,

(2) කපිතාන් වශයෙන් අධිකාරයක් නිකුත් කළ හැක්කේ කපිතාන් නිලයේ අධිකාර ලැබීමට සුදුසු යයි යුද්ධ හමුදපති විසින් අදහස් කරනු ලබන වෘත්තිය හෝ ශිල්පිය සුදුසුකම් ඇත්තාවූද අවසාන තේරීම් මණ්ඩලය විසින් තෝරනු ලැබුවාවූ ද තැනැත්තෙකුටය.

(3) මේජර්වරයකු ලෙස අධිකාරයක් නිකුත් කළ හැක්කේ මේජර් තනතුරේ අධිකාර ලැබීමට සුදුසු යයි යුද හමුදපති විසින් අදහස් කරනු ලබන වෘත්තිය හෝ ශිල්පිය සුදුසුකම් ඇත්තා වූද, අවසාන තේරීම් මණ්ඩලය විසින් තෝරනු ලැබුවා වූද තැනැත්තකුටය.

6. (1) 1956 සැප්තැම්බර් 29 ද හෝ එදිනට පසුව යුද්ධ හමුදවේ අධිකාර ලැබූ සෑම නව ප්‍රවේශක නිලධාරියකුම නියමිත කාල පරිච්ඡේදය තුළදී හෝ දිර්ඝ කරනු ලබන කාල පරිච්ඡේදය තුළදී ස්වකීය රාජකාරි කටයුතු රාජ්‍ය භාෂාවෙන් කර ගෙන යාමට අවශ්‍ය ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතුය යන කොන්දේසියට යටත් විය යුතුය.

(2) 1956 ජූලි මස 16 වනදයින් පසු යුද්ධ හමුදවේ අධිකාර ලැබූ සෑම නව ප්‍රවේශක නිලධාරියකුම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ නියමයන්ට හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීයි සඳහා තත් කාලයෙහි බලාත්මකව පවතින යම්කිසි නියෝග වලට හෝ මතු කාලයෙහි සාදනු ලැබිය හැකි වෙනත් යම් නියෝගවලටද, යටත් විය යුතුය යන කොන්දේසියට යටත් විය යුතුය,

### රෙජිමේන්තු මය ස්වභාවයෙන් පරිබාහිර වූ සේවා නියුක්තිය

7. (1) රෙජිමේන්තුමය ස්වභාවයෙන් පරිබාහිර වූ කටයුතු ඉටු කිරීම සඳහා මේජර් නිලයකට හා ඉන් පහළ නිලයකට කෙරෙන සේවා නියුක්තියක් යුද හමුදපති විසින් කළයුතු අතර එවැනි සේවා නියුක්තියක් සඳහා සුදුසු නිලධරයකු තමාට නිර්දේශ කිරීම සඳහා ඔහු විසින් නිලධාරි මණ්ඩලයක් පත් කළ යුතුය. කෙසේ වෙතත් ආඥපති ලේකම් කාර්යාලයේ සේවා නියුක්තියකදී හෝ අධි සහායක හෝ අතිරේක අධි සහායක හෝ නිත්‍ය බලකායේ තමාගේ සමගාමී නිලයක් දරන්නකු සිටින්නාවූ ද ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය (ස්වේච්ඡා) බලකාය හැර වෙනත් ස්වේච්ඡා බල ඒකකයක අජුටාන්ට් යන නිල සඳහා එවැනි මණ්ඩලයක් පත් කිරීම අවශ්‍ය නොවන්නේය.

(2) රෙජිමේන්තු ස්වභාවයෙන් පරිබාහිර වූ සේවාවකට පත් කෙරෙන නිලධාරියකුගේ එක් අවස්ථාවක සේවා කාල පරිච්ජේදය, කපිතාන් හා ඊට පහළ නිල සම්බන්ධයෙන් අවුරුදු දෙකක්ද මේජර් හා ඊට ඉහළ නිල සම්බන්ධයෙන් අවුරුදු තුනක්ද නො ඉක්මවිය යුතුය. එසේ වුවත් යුද හමුදපති විසින් සේවයේ අවශ්‍යතා අනුව එම කාල පරිච්ජේදයන් දීර්ඝ කරනු ලැබිය හැකිය.

8. යුද්ධ හමුදවේ සිවු වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක්, කිසිම නිලධාරියකු යුද්ධ හමුදවේ හෝ සේනා සැකසුම් මූලස්ථානයක පත් වීමක් දූරිම සඳහා සුදුසු නොවිය යුතුය. එසේද වුවත් සේවයේ අවශ්‍යතා සලකා මෙම නියමය යුද්ධ හමුදපති විසින් අත්හැර දමනු ලැබිය හැකිය.

9. යුද්ධ හමුදවේ අධිකාර ලත් සේවයක වසර තුනකට නොඅඩු සේවයක් සම්පූර්ණ නොකළාවූ ද ලුතිනන් නිලයේ සිට කපිතන් නිලයට උසස් කිරීමේ විභාගය සමත්වී නැත්තාවූද නිලධාරියෙක් ඔහුගේම ඒකකයේ හැර වෙනත් ඒකකයක අජුටාන්ට් වශයෙන් පත් කිරීමට සුදුස්සෙක් නොවන්නේය. එතෙකුදු වුවත් යුද හමුදපති විසින් මෙම නියමය අත්හැර දමනු ලැබිය හැකිය.

### විශේෂ පත්වීම්

10. (1) අධිකාර ලත් සේවයක වසර තුනක් සම්පූර්ණ නොකළ කිසිම නිලධාරියකු අධි සහායක හෝ අතිරේක අධි සහයක වශයෙන් පත් නොකළ යුතුය.

(2) අධි සහායක හෝ අතිරේක අධි සහායක වශයෙන් පත් කරන නිලධාරියෙකුගේ සේවා කාල පරිච්ඡෙදය වසර තුනකට නොවැඩි විය යුතුය· එසේ වුවත් ජනාධිපතිවරයාගේ අධි සහායක හෝ අතිරේක අධි සහායක වශයෙන් පත් කරනු ලබන නිලධාරියකු සම්බන්ධයෙන් මෙම නියෝගය බල නොපාන්නේය.

(3) එබඳු සේවා කාලයක් නිම කළාවූ නිලධාරියෙකු ඉන් පසු වසර දෙකක් ගත වනතෙක් නැවත පත් කිරීම සඳහා සුදුසුකම් නො ලබන්නේය.

(4) ලුතිනන් කර්නල් නිලයේ හෝ ඊට ඉහළ ඕනෑම නිලයක වෛද්‍ය නිලධාරියෙක් ජනාධිපතිවරයාගේ ගරු කායික වෛද්‍ය හෝ ගරු ශල්‍ය වෛද්‍ය හෝ වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

### ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම

11. (1) තෝරාගත් මේජර්වරුන්ගේ නාමලේඛනයකින් ලුතිනන් කර්නල් නිලයට උසස්වීම් කරනු ලැබිය යුතුය. තෝරාගත් මේජර්වරුන්ගේ නාම ලේඛනය යුද හමුදාපති විසින් පවත්වා ගත යුතුය. තෝරාගත් මේජර්වරුන්ගේ නාමලේඛනයේ ඇතුළත් කෙරෙනු ඇත්තේ නිත්‍ය මේජර් නිලයේ යටත් පිරිසෙයින් දෙවසරක්වත් සම්පූර්ණ කොට ඇත්තාවූ නිලධාරීන් සහ ආසන්න පූර්ව තුන් වසර තුළදී අදාල අණදෙන නිලධාරීන් විසින් උසස් කිරීම සඳහා නිර්දේශ කොට ඇත්තාවූ නිලධාරීන් ද සලකා බලා ජ්‍යෙෂ්ඨ නිලධාරි මණ්ඩලයක් විසින් එකී නිලධාරීන් අතරින් නිර්දේශ කරනු ලබන තැනැත්තන්ය.

(2) ලුතිනන් කර්නල් නිලයට උසස් කොට දෙන පත්වීම්, කිසියම් විශේෂිත ඒකකයක අණදීම අරබයා වූ එකක් නම්, එය ලැබිය යුත්තේ ප්‍රථම වශයෙන්ම එම ඒකකය අයත් වන රෙජිමේන්තුවේ හෝ බලකායේ නිලධාරියකුටය. අදාල රෙජිමේන්තුවේ හෝ බලකායේ සුදුසු නිලධාරියකු නැත්නම් 31 වගන්තියේ විධි විධාන යටතේ යුද හමුදාපති විසින් වෙනත් කවර හෝ රෙජිමේන්තුවකින් නැත්නම් බලකායකින් නිලධාරියකු තෝරා ගෙන ඔහු පත් කළ යුතුය.

(3) ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීමෙන් පසු දෙනු ලබන පත්වීම වූ කලී, ඒකකයක අණදෙන නිලධාරී පුරප්පාඩුවක් හැර වෙනත් පුරප්පාඩුවක පත්වීමක් වේ නම් එම පත්වීම ලබන්නා ජ්‍යෙෂ්ඨතාව අනුව එම පුරප්පාඩුවට සුදුසුයයි සැලකෙන නිලධාරියාම විය යුත්තේය.

### කර්නල් හා ඊට ඉහළ නිල වලට කෙරෙන උසස් කිරීම්

12. (1) කර්නල් සහ ඊට ඉහළ නිල සඳහා උසස් කළ යුත්තේ තෝරා ගැනීමෙනි. කර්නල් නිලයකට උසස් කිරීමේදී, උසස් කිරීමට අදාල නිලය හා පත්වීම සඳහා හොඳම සුදුසුකම් ඇතැයි සැලකෙන නිත්‍ය ලුතිනන් කර්නල්වරයාට පමණක් එම උසස්වීම දිය යුතුය. බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීමේදී, උසස් කිරීමට අදාල එම නිලය හා පත්වීම සඳහා හොඳම සුදුසුකම් ඇතැයි සැලකෙන නිත්‍ය කර්නල් වරයාට පමණක් එම උසස්වීම දිය යුතුය.

(2) එසේ කෙරෙන සෑම තෝරා ගැනීමකදීම :—

(අ) නිලධාරියාගේ පසුගිය කාලයේ සේවා වාර්තාව,

හා

(ආ) ඔහු උසස් කිරීම පැහැදිලිවම යුද්ධ හමුදාවේ උපරිම යහපතට හේතුවේද යන ප්‍රශ්නය සලකා බැලිය යුතුය.

### ක්වාටර් මාස්ටර් වරුන් උසස් කිරීම

13. (1) මෙම නියෝගවල (2) ඡෙදයේ සඳහන් වන අධිකාරලත් සේවා කාල පරිච්ඡෙද සම්පූර්ණ කළ ක්වාටර් මාස්ටර්වරයකුට, මතු දැක්වෙන සුදුසුකම් තිබේ නම් ඔහු කපිතාන්, මේජර් හෝ ලුතිනන් කර්නල් යන මේවායින් අදාල නිත්‍ය නිලයකට පත් කරනු ලැබිය හැකිය.

(අ) යුද හමුදාපති විසින් අදාළ නිලය සඳහා තීරණය කරනු ලබන පරීක්ෂණයකින් සමත් වී තිබීම.

(ආ) උසස් කිරීම සඳහා සුදුසු යයි ඔහුගේ අණදෙන නිලධාරියා විසින් නිර්දේශ කොට තිබීම. එතෙකුදු වුවත්, සක්‍රිය සේවයේ කැපී පෙනෙන දක්ෂතාවක් හා නිර්භීත කමක් දක්වා ඇති කිසියම් නිලධාරියෙක් වේ නම් විශේෂ තත්ත්වයන් යටතේ ජනාධිපතිවරයාගේ අනුමතිය ඇතිව යුද හමුදාපති විසින් ඔහු යට කී පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබිය හැකිය.